**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී වත්කම් මිලදීගැනීම් හා ඉදිකිරීම් වෙනුවෙන් වැය කරන ලද එකතුව රු.17,096,857 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | 2023.11.01 දින සිට 2023.12.31 දින දක්වා මිලදී ගත් වත්කම් හඳුනා ගැනීම, සත්‍යාපනය සහ මූල්‍ය කමිටුව හරහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම 2023 වර්ෂය තුලදීම සිදු කිරීම ප්‍රායෝගික නොවූ නිසා 2024 වර්ෂයේදී විශ්වවිද්‍යාලය වෙත භාරදීමට තීරණය කරන ලද බව. | ජංගම නොවන වත්කම් මිලදී ගත් වර්ෂය තුළදීම එම වර්ෂයට අදාළව ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් යටතේ දක්වන ලද රු. 2,173,402 ක් වූ භාවිතයට නොගත් රාජ්‍ය ප්‍රදාන හා ජංගම නොවන වගකීම් යටතේ දක්වන ලද රු. 33,372,413 ක් වූ වන්දි සඳහා වෙන්කිරීම් කිසිදු හේතු දැක්වීමකින් තොරව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි පෙර වර්ෂයේ ගැලපීම් ලෙස දක්වා පොදු සංචිතයට ගැලපීම් සිදුකර තිබුණි. | ප්‍රාග්ධන ප්‍රදාන සහ වන්දි සඳහා ප්‍රතිපාදන යන වගකීම් ශේෂ වල සංසන්දනාත්මක තොරතුරු ඉකුත් වර්ෂයේදී ගැලපීම හේතුවෙන් ඉවත් කරන ලදි. ඊට අදාළ ගැලපීම් සිදු කළ පොදු සංචිත ශේෂයෙහි සංසන්දනාත්මක තොරතුරු යාවත්කාලීන කරන ලද බව. | මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකරනු ලබන ගැළපීම් සඳහා විස්තරාත්මක හෙළිදරව් කිරීම් සිදුකළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | අතරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02ක් ඉක්මවූ එකතුව රු.37,166,338 ක තැන්පතු 59 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකතුව රු. 15,762,675 ක් වූ අවසන් බිල්පත් ගෙවූ පසු හා ඉතිරි රු. 9,425,480 ක මුදල වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු නිදහස් කරන අතර එකතුව රු.7,358,191ක අතරුදවුම් සඳහා සැපයුම්කරුවන්ට සිහිකැඳවීම් ලිපි යවා නිදහස් කිරීමට හෝ ඉතිරිය රාජ්‍ය ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ | 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, සේවයෙන් ඉවත්ව ගිය, වැටුප් රහිත අධ්‍යයන | නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු. 154,750 ක ණය මුදල් අය කරගෙන ඇති අතර තවත් නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු ණය | අදාළ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | 4.2.2, 4.5, 4.6 හා 6.3 වන වගන්තිය | නිවාඩු ලබාගත් හා මියගිය නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.897,095 ක් වසර 01 සිට වසර 16 අතර කාලයක සිට අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | බැඳුම්කර ගිවිසුම් වටිනාකමට ඇතුලත් කර අයකර ගැනීමට ද ඉතිරි නිලධාරීන්ගේ අයවිය යුතු ණය මුදල් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | යුතුය. |
| **(ඇ)** | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය** | | | |
| (i) | XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව 2023 වර්ෂය තුළ දී වැටුප් හා දීමනා ලෙස රු.950,299,631 ක් ගෙවා තිබුණි. | වැටුප් අංශය විසින් සෑම මසකම අවසානයේදීම වැටුප් හා වේතන ගෙවීමට පෙර අදාළ අංශ ප්‍රධානීන්ගෙන් නිළධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් ලබා ගෙන ඇති බව. | ආයතන සංග්‍රහය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | V පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2015 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුලදී බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.125,662,225 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | 2023.12.31 දිනට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් අයවිය යුතු මුදලින් රු.125,662,225 ක් අයකර යුතුව පවතින බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝම්බර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපිය | මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව විදේශ ප්‍රදාන මත ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක වන අතර ඉන් ව්‍යාපෘති 02 ක් සඳහා 2023 වර්ෂය තුළ දී රු.15,437,938 ක විදේශ ප්‍රදාන ලැබී තිබුණි. | 2024 අප්‍රේල් 19 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බව. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය හා එකඟතාවය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිල නිවාස කුලිය චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් 72 දෙනෙකුගෙන් එකතුව රු.4,804,939ක නිල නිවාස කුලී අය නොවී පැවතුණි. | නිවාස කමිටුවේ නිර්දේශ හා පාලක සභාවේ අනුමැතිය මත ජ්‍යෙෂ්ඨ නිල නිවාස සඳහා මසකට රු.2,000ක් ද නිවාස සංකීර්ණයේ නිලධාරීන්ගෙන් රු.1,000ක මුදලක් ද අය කරනු ලබන බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 650,178,172 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද පරිගණක පද්ධතියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගනණය කිරීමෙන් පසු ස්ථාවර වත්කම් වාර්තාකරණ පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කරනු ලැබේ. එක් එක් වර්ෂයේ මිලදී ගත් ස්ථාවර වත්කම් ඇතුලත් ලේඛනයක් සාමාන්‍ය පරිපාලන අංශය මඟින් නඩත්තු කරන බව. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/ 2023 දරන චක්‍රලේඛ ලිපියේ 5වන ඡේදය | බැඳුම්කර කඩ කරන ලද ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන තිබූ රු.12,562,232 ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතුකර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 අනුව බැඳුම්කර ගිවිසුම් කඩ කිරීමෙන් ලද මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සිදු කළ නොහැකි බව දන්වන අතර නව චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබුවහොත් ඒ අනුව කටයුතු කරනු ලබන බව. | අයකර ගත් මුදල් භාණ්ඩාගාරය වෙත යැවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.310,420,127 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.225,687,938ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.536,108,065 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ආදායම් රැස් කිරීම ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 16 සිට සියයට 229.33 දක්වා පරාසයක වර්ධනයක්ද වියදම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 4 සිට සියයට 87.64 දක්වා වර්ධනයක්ද නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 28 දිනැති අංක 2004/ED/HE/45 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් ශිෂ්‍යයන්ට හා නිලධාරීන්ට සැපයීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් 2008 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.288,798,652 ක් වැය කර බාහිර නේවාසිකාගාර පහසුකම් ලබා ගෙන තිබුණි. | 2015 වසරේ සිට නේවාසිකාගාර ඉදි කිරීමට කටයුතු කරන අතර අක්කර 12ක ඉඩමක් පවරා ගෙන සිසුන් 2000කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අපේක්ෂා කරන බව. | ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් සැපයීම වෙනුවෙන් නව නේවාසිකාගාර ඉදිකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 16 ක සිසුන් 1639 දෙනෙකු ලියාපදිංචි කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණ ද සිසුන් 1166 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබීමෙන් පුරප්පාඩු 473 ක් සඳහා සිසුන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලද ශිෂ්‍ය ලියාපදිංචි ලැයිස්තු අනුව උපාධි පාඨමාලාවන්ට සිසුන් බඳවා ගැනීමට කටයුතු කරන බව. | අනුමත සිසුන් ප්‍රමාණය අදාල පාඨමාලා සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ 133 දෙනෙකු වෙනුවෙන් ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු. 80,381,472 ක් ගෙවා තිබුණි. | අංක 2004/ED/HE/45 දරන කැබිනට් පත්‍රිකාව ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ නිළධාරින් සඳහා නවාතැන් පහසුකම් සලසා දෙන ලදි. පාලක සභාවේ තීරණයක් මත 2017 වසරේ සිට නේවාසිකාගාර ලබා දීම වෙනුවට නිළධාරින් සඳහා යම් සීමාවන් මත කොටසක් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරන ලද බව. | විධිමත් අනුමැතියක් මත දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් හා ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් උපදේශක ආයතන සහය ලබා දී තිබියදී 2015 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ ඉංජිනේරු තනතුරක් සඳහා 2015 දෙසැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාල පරිච්ඡේදයක් සඳහා රු.50,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයෙකු අර්ධ | ඉංජිනේරුවරයකු අර්ධ කාලීනව ලබා ගැනීම සඳහා ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු බව දන්වමින් දැන් වූ ලිපියෙන් සේවය ලබා දීමට නිදහස් කර ඇති බව දන්වන ලදි. එම ලිපිය අනුව මෙම පත් කිරීම සිදු කර ඇති බව. | නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලීනව පත්කර තිබුණි. එදින සිට අඛණ්ඩව සේවා කාලය දීර්ඝ කර තිබූ අතර 2018 ජුනි 01 දින සිට මාසික දීමනාව රු.75,000 ක් දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2023 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.6,225,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | | |
| (ඉ) | විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා වන මූලික සුදුසුකම් සම්පූර්ණය කර නොතිබුණු අයදුම්කරුවෙකු 2008 සැප්තැම්බර් 05 දින ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට බඳවාගෙන තිබූ අතර ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ නිරවද්‍යතාවය සනාථ කර ගැනීමකින් තොරව සේවය ස්ථිර කර තිබුණි. තවද, 2019 ඔක්තෝබර් 07 දින සිට විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරට උසස් කර තිබුණ අතර 2008 ඔක්තෝබර් 15 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.22,895,602 ක් ගෙවා තිබුණු අතර තනතුරට හිමි අනෙකුත් ප්‍රතිලාභ ලබා දීමත් සිදු කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරට පත් කර ඇති අතර නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරෙහි ස්ථිර කරන අවස්ථාවේදී ඉදිරිපත් කොට තිබූ අධ්‍යාපන සුදුසුකම් වල නිරවද්‍යතාවය අදාළ ආයතන වෙතින් සනාථ කරගෙන ඇති බව. | අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | විශ්වවිද්‍යාලය සඳහා විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතියක ඇති අවශ්‍යතාවය දැඩිව ඉස්මතු කර දක්වමින් 2021 වර්ෂයේදී ඇස්තමේන්තු වටිනාකම රු.35,832,218 ක් වූ (බදු රහිත) විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු.79,475,047 ක් වැය කර 2022 ඔක්තෝම්බර් 12 දින නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අමතරව වැය කරන ලද රු.43,642,829ක් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර අදාළ ලිපිගොනුව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත් සමාගම් හා උපදේශන සමාගම් මඟින් ඉල්ලා ඇති ගෙවීම් හා අනෙකුත් තොරතුරු ලබා දීමට ලිපි ගොනු රැගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අමතර ගෙවීම් නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ආරක්ෂක සේවය ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී 2020 ඔක්තෝබර් 01 සිට 2023 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා අවස්ථා 02ක දී අවම ලංසු ඉදිරිපත් කර තිබුණු සමාගම් ප්‍රතික්ෂේප කර තෙවන අවම ලංසුව ඉදිරිපත් කළ ආරක්ෂක සමාගම පිළිගැනීම හේතුවෙන් රු.14,380,776 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | දිනක අවම වැටුප අනුව නිවැරදිව ලංසුපත් ඉදිරිපත් කර ඇති ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කර ඇති බව. | රජයට උපරිම වාසිදායක වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ආපන ශාලාව හා නව ආපන ශාලාව බදු දී තිබූ අතර ආපනශාලා ටෙන්ඩර් කොන්දේසි අනුව, තමා විසින් ඉවුම් පිහුම් කටයුතු සඳහා සේවකයින් යෙදවිය යුතු විය. එහෙත් ඉවුම් පිහුම් කටයුතු වෙනුවෙන් යොදවන ලද සේවිකාවන් 09 දෙනෙකු සඳහා 2023 අප්‍රේල් 01 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා වූ මාස 05 ක කාලය සඳහා පමණක් විශ්වවිද්‍යාල අරමුදලින් දීමනා ලෙස එකතුව රු.3,762,024 ක් ගෙවා තිබුණි. | 2023 වසර සඳහා වූ ටෙන්ඩරයේ කොන්දේසි ප්‍රකාරව ගෙවීම නිවැරදි නොවන බැවින් 2024 පෙබරවාරි 20 දින සිට ගෙවීම් අත්හිටුවා ඇති අතර සිදු කරනු ලැබූ ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරක් වන ඉඩම් පවරා ගැනීමේ කටයුතු අධීක්ෂණය සඳහා 2017 දෙසැම්බර් 06 දින සිට විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු බඳවාගෙන 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි මාසිකව රු.50,000ක් බැගින් පත්වීම් දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.3,650,000ක් ගෙවා තිබුණි. එහෙත් එම නිලධාරියා පත්කර වසර 05ක කාලයක් ගත වී තිබුණ ද ප්‍රකාශිත ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/IDD/GEN/01 දරන ලිපිය මඟින් ඉඩම් පවරා ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු 2017 දෙසැම්බර් 11 වන දින පත් කර ගෙන ඇත. මෙම නිලධාරියා පැමිණීමෙන් පසු හෙක්ටයාර 0.8119 ක ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර ඇති අතර අක්කර 12 ක හා අක්කර 05ක ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුහුණු තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය “ආ” කාණ්ඩයේ තනතුරකට 2016 අප්‍රේල් 01 දින පත්වීම ලද අයදුම්කාරියගේ අධ්‍යාපන සහතික තහවුරුකර ගැනීම විශ්වවිද්‍යාලය විසින් 2021 ඔක්තෝම්බර් මාසයේදී සිදු කර තිබූ අතර එහිදී එම සහතික ව්‍යාජ සහතික බවට තහවුරුව එයට අදාළ කාලපරිච්ඡේදය තුළදී එකතුව රු.3,275,787 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සහතිකපත් නියමිත කාලය තුළ සනාථ කර නොගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | නිලධාරිනියගේ විභාග ප්‍රතිඵල විෂමතාවය පිළිබඳ පරීක්ෂණයක් සිදු කිරීමට 2021.07.07 දින බදුල්ල පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති වෙත පැමිණිලි කර ඇත. ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර නඩු කටයුතු ආරම්භ කර ඇති බව. | අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර විශ්වවිද්‍යාල අරමුදලට අදාළ පාර්ශවයන්ගෙන් සිදු වී තිබූ පාඩුව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණු තාක්ෂණික නිලධාරී තනතුර සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභා අනුමැතිය මත අවම අධ්‍යාපන සුදුසුකම් හෝ සපුරා නොතිබුණු නිලධාරියකු මාසිකව රු.50,000ක දීමනාවක් මත 2019 අප්‍රේල් 10 වන දින සිට ද පුහුණු තාක්ෂණික නිලධාරියකු මාසිකව රු.40,000 ක දීමනාවක් මත 2019 ජූලි 01 දින සිට ද බඳවාගෙන තිබුණි. එම නිලධාරින්ගේ දෛනික පැමිණීම සහ පිටවීම සනාථකර ගැනීමකින් තොරව තාක්ෂණික නිලධාරියා හා පුහුණු තාක්ෂණික නිලධාරියා වෙනුවෙන් පිළිවෙලින් 2023 දෙසැම්බර් 31 දින හා 2023 ජූලි 08 දින දක්වා එකතුව රු.4,720,000 ක දීමනා ගෙවා තිබුණි. | අනුමත වූ ව්‍යාපෘති සියල්ල නිවැරදිව නියමිත වේලාවට කාර්යක්ෂමව සිදු කරගත යුතු වූ බැවින් වසරක පළපුරුද්ද හා ඉංජිනේරු සැලසුම් ශිල්පී ලෙස පුහුණුව ලබා ඇති නිලධාරින් දෙදෙනා හා ව්‍යාපෘති ඉංජිනේරුවරයා වැඩ පැවරුම් පදනම මත බඳවා ගන්නා ලදි. මෙම තනතුරු සඳහා අනුමැතිය ඉල්ලා ඇති අතර මේ දක්වා අනුමත වී නොමැති බව. | බඳවාගැනීම් වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගතයුතු අතර අවිධිමත් ලෙස ගෙවා ඇති වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ආරක්ෂක පරීක්ෂක (වැඩ පැවරුම්) තනතුරක් සඳහා පුරප්පාඩු නොපැවතියදී 2021 දෙසැම්බර් 05 දින නිලධාරියෙකු බඳවාගෙන එදින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.1,225.000ක් විශ්වවිද්‍යාල අරමුදලින් දීමනා ලෙස ගෙවා තිබුණි. | ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරේ පුරප්පාඩු පවතින හෙයින් වැඩ පැවරුම් පදනම මත බඳවා ගෙන ඇත. 2024.04.30 දින සිට මොහුගේ සේවය දීර්ඝ නොකරන ලද බව. | අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ගෙවා ඇති වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | විවෘත බඳවා ගැනීම් යටතේ අදාල සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා 2018 අගෝස්තු 01 දින බඳවාගෙන තිබුණි. තවද 2022 මාර්තු 02 දින සිට වැඩබලන පුස්තකාලාධිපති තනතුරටද පත්කර 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.18,420,538 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | 134 වැනි පාලක සභාවේදී අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් සැලකිල්ලට ගෙන 2018 අගෝස්තු 01 දින සිට වසර 03ක කාලයක් සහකාර පුස්තකාලාධිපති තනතුරෙහි පිහිටුවා 2021 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති (II ශ්‍රේණිය) තනතුරට උසස් කරන ලද බව. | අවිධිමත් බඳවා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ගෙවා ඇති වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45(2)(1)(vi) වගන්තිය අනුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව උත්තර මණ්ඩලය වෙත හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පාලක සභාවේ කාර්යයක් වුවද විශ්වවිද්‍යාලය විසින් 2022 හා 2023 වර්ෂවලට අදාළව වාර්ෂික වාර්තා 2024 ජූනි 30 වන විටත් පිළියෙල කර නොතිබුණි. | 2022 සඳහා වාර්ෂික වාර්තා සකස් කර හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට ප්‍රමුඛත්වය දෙන අතර 2023 වාර්ෂික වාර්තාව 2024 සැප්තැම්බර් මස අගවන විට සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | වාර්ෂික වාර්තාව කාලීනව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |